# සංකාරා ගෙනෙන පණිවුඩය

බටහිර රසායනික විද්‍යාවට අනුව හයිඩ්‍රජන් වායුවු හයිඩ්‍රජන් අණුවලින් සමන්විත වන අතර හයිඩ්‍රජන් අණුවක් හයිඩ්‍රජන් පරමාණු දෙකක රසායනික එකතුවකින් නිර්මාණය වෙයි. හයිඩ්‍රජන් වායුව පමණක් ඇති භාජනයක් අපට සිතාගත හැකි ය. එයට වෙනත්  වායුවක් මිශ්‍ර වුවහොත් අපි එය තවදුරටත් පිරිසිදු හයිඩ්‍රජන් ලෙස නොසලකමු. කැලණි ගඟේ ජලය ගැන කතාකිරීමේ දී ද එවැනි සම්මුතියක පිහිටීමට අපට සිදුවෙයි. මෙහි දී ජලය යනු කිනම් රසායනික ද්‍රව්‍යයක් ද යන්න පිළිබඳ අපට ප්‍රශ්නයක් නැත. බටහිර විද්‍යාවට හා නිව්ටෝනීය සුසමාදර්ශයට අනුව ජලය (අමිශ්‍ර) රසායනික ද්‍රව්‍යයක් ලෙස සැලකුවහොත් ඒ ඇත්තේ කොළඹ ද මහනුවර ද යන්න අනුව වෙනස් නො වෙයි. ඒ සැම තැනකම ඇත්තේ ජලය ය.

එහෙත් කැළණි ගඟේ ජලය මහවැලි ගඟේ ජලයෙන් වෙනස් යැයි අපි කියමු.  ඒ ජලය පමණක් නොව අපද්‍රව්‍ය ද සැලකීමෙන් ය. ඒ වඩාත් නිවැරදිව ප්‍රකාශකිරීමට නම් අසවල් වෙලාවට අසවල් ගඟේ අසවල් ස්ථානයේ දී ලබාගත් ජලය යනුවෙන් විස්තර කළ යුතු ය. එසේ ඒ ඒ තැනේ දී අප සලකා බලන්නේ අපද්‍රව්‍ය මිශ්‍ර වූ ජලය බව පැහැදිලි විය යුතු ය. බටහිර රසායන විද්‍යාව ජලයේ ගුණ යනුවෙන් සඳහන්කරන්නේ ඒ ඒ ජලාශයේ හෝ ගඟේ හෝ වෙනත් තැනක හෝ ඇති අපද්‍රව්‍ය මිශ්‍ර ජලය නොව හයිඩ්‍රජන් පරමාණු දෙකක් ඔක්සිජන් පරමාණුවක් සමග රසායනික ක්‍රියාවක් මගින් නිර්මාණය වන අණු එකතුවකට ය. මේ ගුණ ඒ ඒ නියැදියෙන් නියැදියට වෙනස් නොවන්නේ ය යන්න බටහිර විද්‍යාවේ ඉගැන්වෙන්නකි. එහි දී කෙරෙන්නේ ජලය හෝ වෙනත් යමක් සාධාරණීයකරණයකි. බටහිර භෞතික විද්‍යාවේ හෝ රසායන විද්‍යාවේ හෝ එසේ සාධාරණය කළ හැකි ය.

එබැවින් චුම්බකවල ගුණ කවරේදැයි බටහිර භෞතික විද්‍යාවට කිව හැකි ය. ලංකාවේ යම් උෂ්ණත්වයක දී චුම්බකයක ගුණ එංගලන්තයේ දී ඒ උෂ්ණත්වයේ දී චුම්බකයක ගුණෙන් වෙනස් නො වෙයි. එබැවින් චුම්බකයක් පෙන් වූ කල එහි මෙවැනි ගුණ ඇතැයි බටහිර විද්‍යාඥයෝ පවසති. මෙය සාධාරණීකරණයෙන් ලබාගන්නා වූ ප්‍රතිඵලයකි. එක් චුම්බකයක් දුටු පමණින්, නැතහොත් එහි ගුණ නිරීක්ෂණය කළ පමණින් අපට අදාළ අවශ්‍යතා යටතේ වෙනත් ඕනෑම චුම්බකයක ගුණ කිවහැකි යැයි එහි දී උපකල්පනය කෙරෙයි.

අප කලින් ද කියා ඇති පරිදි සාධාරණීකරණය එක් අතකින් ගත්කල වියුක්තකරණයකි. චුම්බකයක් රික්තයක ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න දැනගැනීමට කිසි දා නො හැකි ය. එයට හේතුව චුම්බකයක් තිබූ සැණින්  රික්තය නැතිවන බැවිනි. එහෙත් රික්තයක ඇති චුම්බකයක ගුණ ගැන බටහිර භෞතික විද්‍යාවෙහි හැදෑරෙයි. එසේ කෙරෙන්නේ වියුක්තව චුම්බකය හැරෙන්නට වෙනත් දෙයක් නැතැයි උපකල්පනය කරමිනි. කෙසේ වෙතත් සාමාන්‍ය ජීවිතයේ දී චුම්බකයට අමතරව වෙනත් ද්‍රව්‍ය හා විකිරණ ද ඇති බැවින් අප නිරීක්ෂණය කරන්නේ චුම්බකයක් එවැනි වටාපිටාවක දී හැසිරෙන ආකාරය ය.

මෙහි  දී අවධාරණය බළ යුතු කරුණ නම් ඒ අනෙක් සියල්ල යම් ආකාරයකින් ඉවත් කළ ද චුම්බකය හා නිරීක්ෂකයා ඉවත්කළ නොහැකි බව ය. චුම්බකය ඉවත්කළහොත් නිරීක්ෂණයකිරීමට දෙයක් නැත. නිරීක්ෂකයා ඉවත්කළහොත් නිරීක්ෂණයකිරීමට කිසිවකු නැත. එහෙත් අපි රික්තයක (එනම් කිසිවක් හෝ කිසිවකු නැති තැනක) චුම්බකවල ගුණ හදාරමු. එපමණක් නො වේ. එක් චුම්බකයක ගුණ නිරීක්ෂණය කළ පමණින්  අනෙක් චුම්බකවලට ද එවැනි ගුණ ඇතැයි කියමු. මෙහි කිසිදු වලංගුබවක් නැති වුවත් මේ නිරීක්ෂණ අතර ඇති සමානත්ව හේතුකොටගෙන එවැනි සාධාරණකිරීමක් හා වියුක්තකිරීමක් අපට ප්‍රශ්න ඇති නොකරන්නේ යැයි අපි සිතමු.

බටහිර විද්‍යාවේ මේ උපකල්පනය ගැලීලියෝ විද්වතා විසින් කරණ ලදැයි සැලකෙන පීසා නුවර ඇළවෙන කුළුණේ පරීක්ෂණයෙහි ද ඇත. අප ඒ බව කලින් මෙයට වඩා අඩු මට්ටමකින් සාකච්ඡාකර ඇත. අප එහි දී පෙන්වූයේ පරීක්ෂණය කළ තැනැත්තා කවුරුන් වුව ද ඔහු රික්තයක් නිර්මාණය නොකළ බව ය. අප මෙහි දී ඒ අදහස තවදුරටත් වර්ධනයකරමින් කියා සිටින්නේ එහි රික්තයක් නොතිබුණේ සාමාන්‍යයෙන් රික්තයක් යැයි කියන්නක් නොතිබූ නිසා පමණක් නොව අතහරිණු ලැබූ වස්තු දෙකක්, කුළුණක් හා නිරීක්ෂකයකු (හෝ නිරීක්ෂකයන්) සිටි බැවින්

© Prof. Nalin De Silva

එහි රික්තයක් නොතිබූ නිසා බවත් කිසි දිනෙක රික්තයක් නිර්මාණය කර කිසිම පර්යේෂණයක් නොකළ හැකි බවත් ය. චිත්ත පරීක්ෂණ (thought experiments) ලෙස සෛද්ධාන්තික ව මිස ප්‍රායෝගිකව එවැනි පර්යේෂණ කළ හැකි නො වෙයි.

බටහිර භෞතික විද්‍යාවේ මේ ආකල්ප බටහිර අනෙක් විද්‍යාවන්ට පමණක් නොව සාහිත්‍යයට ද පැතිරී ගියේ ය. ඉතාමත් භෞතිකවාදී ලෙස පෙනී ගිය ද මේ ආකල්ප පිටුපස ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි දෙවියන්වහන්සේ ය. උන්වහන්සේට කිසිවකු නැති තැනක කිසිවක් නැතත් නිරීක්ෂණය කළ හැකි ය. එසේ කෙරෙන්නේ උන්වහන්සේගේ මනසෙහි ය. ඉතාමත් දැඩි භෞතිකවාදියාට අවසාන වශයෙන් පිහිටවන්නේ දෙවියන්වහන්සේගේ මනස ය. අවසාන යථාර්ථය අන්කිසිවක් නොව දෙවියන්වහන්සේගේ මනස ය.

මෙවැනි කරුණු ගෙනහැර දැක්වීම ඊනියා යථාර්ථවාදීන්ට හා අනාගමිකවාදීන්ට ඓහික (secular) නොවන වැඩකි. එසේත් නැතහොත් අන්‍යාගම්වලට පහරගැසීමකි. මොවුන් කිසිදාක තේරුම් නොගන්නා කරුණ නම් බටහිර විද්‍යාව හා පොදුවේ බටහිර දැනුම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය කෙරී ඇති බව ය. නටහිර දැනුම ගැන කතාකරන විට අපට බටහිර ආගමකට නොව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට යොමුකිරීමට සිදුවෙයි. ඇතැම් සංස්කෘතීන් හා ආගම් අතර සම්බන්ධයක් තිබූ පමණින් ඊනියා සදාචාරයකට මුවා වී අපට නිසොල්මනේ සිටිය නො හැකි ය.

අපි දැන් මේ සියල්ල සාහිත්‍යයට, සිනමා කලා ආදියට යෙදෙන්නේ කෙසේ දැයි සලකා බලමු. යථාර්ථවාදී සාහිත්‍යය සමග අපට ප්‍රශ්න ඇත්තේ මෙවැනි කරුණුවල දී ය. සාහිත්‍යයෙන් සමාජ යථාර්ථය නිරූපණය විය යුතු යැයි යමකු කී විට ඉන් මූලික වශයෙන් ගම්‍යවන්නේ කුමක් ද? මිනිස් ගතිගුණ යනුවෙන් සාධාරණීකළ හැකි දෑ කවරේ ද? පොදු සමාජයෙහි මිනිස් ගුණ ගැන නොකියා ඒ ඒ විශේෂිත පුද්ගල චරිත සාහිත්‍යයෙන් නිර්මාණය වීම නුසුදුසු ද? වියුක්ත චුම්බකයක් ඇත්තාක් මෙන් සාහිත්‍යයෙහි වියුක්ත මිනිසෙක් සිටී ද?

මොන තරම් ඊනියා යථාර්ථවාදී නොවන සාහිත්‍ය විචාර ඇතැයි කීව ද, නිව්ටෝනීය සුසමාදර්ශය ආධිපත්‍යය දරණ වත්මන් ලෝකයේ සාහිත්‍ය විචාරයෙහි දී පමණක් නොව සාහිත්‍ය කෘති පරිශීලනයෙහි දී ද නිව්ටෝනීය සාධාරණීකරණයෙන් අපට ගැලවීමක් නැත. සංකාරා චිත්‍රපටිය පිළිබඳ ව ගුණදාස අමරසේකර මහතා ද ඇතුළු යථාර්ථවාදී සාහිත්‍යකරුවන් හා විචාරකයන් කරන විවේචනවලින් මතුවන්නේ ඒ චිත්‍රපටියෙන් පුද්ගල කතාවක් පමණක් නිරූපණයවන්නේ ද යන සැකය ය. මෙය හුදෙක් තිර රචකයාගේ හෝ අධ්‍යක්ෂකවරයාගේ හෝ සිතෙහි මැවුණු එකක් පමණ ද? මෙයින් ඊනියා යථාර්ථවාදී සමාජය නිරූපණය නොවන්නේ ද?

අපට සිංහල යථාර්ථවාදී සාහිත්‍යයක් ඇතැයි යන ගජබින්නයට අප යොමු කෙළේ මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. පැරණි සිංහල සමාජයෙහි අදීනත්වය ගැන කතාකළ ද ඒ මහතාට වර්තමානයෙහි බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් අදීන විය නොහැකි විය. බටහිර විද්‍යාව ඉදිරියෙහි දණ්ඩ නමස්කාරකිරීමට ඒ මහතා පෙළඹුනේ ය. අතීත සිංහල අදීනත්වය ගැන කතාකළ අයකු වත්මන් බටහිර දැනුම සම්බන්ධයෙන් නොම්මර එකේ අනුකාරකයකු බවට පත්කිරීමට බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යය සමත් විය. බටහිර යථාර්ථවාදී සාහිත්‍යයෙහි ඇති යථාරාථවාදය අපේ සාහිත්‍යයෙහි ද ඇතැයි කීමෙන් ඒ මහතා බුදුදහම බටහිර විද්‍යාව සමග සංසන්දනයකරන්නන්ට ද මාර්ගෝපදේශකයෙක් විය.

සංකාරා චිත්‍රපටියෙන් නිරූපණය කරන භික්ෂූන්වහන්සේ සම්බන්ධයෙන් භෞතිකවාදී යථාර්ථවාදී විචාරකයන්ට ඇත්තේ ඒ චරිතය යථාර්ථවාදී නොවීම පිළිබඳ ප්‍රශ්නයකි. විශ්වවිද්‍යලයීය කථිකාචාර්යවරයකු වූ භික්ෂූන්වහන්සේ නමක් ගැහැණියක දුටු පමණින් චිත්‍රපටියෙහි මෙන් හැසිරෙයි ද? වෙනත් වචනවලින් කියන්නේ නම් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයක් ලැබූ වත්මන් තරුණ භික්ෂූන්වහන්සේ නමක් තරුණියකගේ පා සළඹ හඬ ඇසුණු පමණින් එලෙස හැසිරිය යුතු නො වෙයි. එහෙත් මේ එතරම් වැදගත් හේතුවක් නො වෙයි. එක් එක් අයගේ මනස් වෙනස්වනවා පමණක් නොව එක් අයකු යැයි කියන්නකුගේ මනස ද කාලයෙන් කාලයට මොහොතෙන් මොහොතට වෙනස් වෙයි. කාලයෙන් කාලයට වෙනස් නොවන මනසක් ඇතැයි ගැනීම තරම් බමුණුවාදයක් ආත්මවාදයක් තවත් ඇත් ද?

© Prof. Nalin De Silva

හැමදාමත් ඇසෙන යම් හඬක් එකා දිනෙක එක් මොහොතක වෙනස් ආකාරයකට ඇසිය හැකි ය. එතෙක් කවදාවත් නොදුටු තරුණියකට ප්‍රේම කරන්නේ ඒ වන තෙක් තරුණියන් නොදුටු අයකු නොවන බව අපි දනිමු. මිනිස් මනස භෞතිකවාදී වස්තුවක් ලෙස නිරූපණයකිරීමට උත්සාහගැනීම නිසා භෞතිකවාදීහු හා යථාර්ථවාදීහු මනස සම්බන්ධයෙන් යටකී අන්දමේ ප්‍රශ්න අසති. බටහිර විද්‍යාවන් අනුව මනස හැඩගැසීමට තැත්කරන බටහිර මනෝවිශ්ලේෂකයන්ට තේරෙන මනසක් නැත.

එහෙත් මගේ ප්‍රශ්නය මනස සම්බන්ධයෙන් ඉදිරිපත්කරන ඊනියා අර්ථකථන නො වෙයි. අපේ ප්‍රශ්නයට ඒ සියල්ලෙහි එතරම් වැදගත්කමක් නැත. මට ප්‍රශ්නය වන්නේ මෙවැනි චරිතවලට භික්ෂූන්වහන්සේ ඈදගැනීම ය. මොන කලා විචාරයක යෙදුණ ද කලාකෘතියක් මගින් අඩුම තරමින් අවිඥානිකව ගෙන යනු ලබන පණිවුඩයක් වෙයි. කලාකෘතිවල පණිවුඩ නැතැයි සිතන්නෝ එක්කෝ වංචනිකයෝ ය; නැත්නම් මුග්ධයෝ ය. මේ පණිවුඩ මුලින් ම පදනම්වන්නේ යථාර්ථවාදයෙහි ය. එමෙන් ම නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ය.

ලොවෙහි අධිපති සුසමාදර්ශය ලෙස නිව්ටෝනීය සුසමාදර්ශයට ඇත්තේ විශාල බලයකි. ගුණදාස අමරසේකර මහතා අවිඥානිකව නිව්ටෝනීය සුසමාදර්ශයෙහි කරවටක් ගිලී ඇත. ඒ මහතා ඉල්ලන්නේ සාධරණීය වූ, පොදු, සංගත භික්ෂු චරිතයකි. සංකාරා චිත්‍රපටියෙහි දැක්වෙන භික්ෂු චරිතය එවැනි පොදු භික්ෂු චරිතයක් නොවන බව ඔහුගේ මතය ය. ඔහුට අවශ්‍ය වන්නේ අධ්‍යක්ෂකවරයා ලවා යථාර්ථවාදී භික්ෂු චරිතයක් නිර්මාණය කරවීමට ය. අමරසේකර මහතා ඒ චරිතයෙහි ව්‍යාජභාවයක් දකියි. ඒ මහතාට අවශ්‍ය අව්‍යාජ යථාර්ථවාදී භික්ෂු චරිතයකි. එහෙත් ප්‍රශ්නය සංකාරා චිත්‍රපටියෙන් භික්ෂු චරිත හඳුනාගන්නාට (අමරසේකර මහතාට නොව) ලැබෙන පණිවුඩය කුමක් ද යන්න ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙරට ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදුන් යථාර්ථවාදී රීතිය ඔස්සේ ගොස් මේ ඊනියා යථාර්ථය යැයි හඳුනාගන්නා තැනැත්තාට චිත්‍රපටියෙන් ලැබෙන්නේ කිනම් පණිවුඩයක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva